# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සුහුරුපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1573/2024 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2024 | දිනය<br>திக<br>Date | 12/10 /2024<br>පැය 2145 |

**මාධ්‍ය නිවේදනය**

**සැකසහිත ලෙස හෝටලයක රැඳී සිටි චීන ජාතිකයින් පිරිසක් අත්අඩංගුවට - පල්ලේකැලේ පොලිස් වසම.**

2024.10.12 වන අද දින උදෑසන කාලයේ පල්ලේකැලේ පොලිස් වසමේ කුණ්ඩසාලේ ප්‍රදේශයේදී මහනුවර කොට්ඨාස අපරාධ විමර්ශන කාර්යංශයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හෝටලයක සැකසහිත ලෙස ලැගුම් ගෙන සිටි චීන ජාතිකයින් 129 දෙනෙකු අත්අඩංගුවට ගෙන ඇත.

මෙම චීන ජාතිකයින් අන්තර් ජාලය ඔස්සේ මුදල් වංචා සිදු කරන බවට සැකපිට අත්අඩංගුවට ගෙන ඇති අතර, ඔවුන් සන්තකයේ තිබී **ලැප්ටොප් පරිගණක යන්ත්‍ර 100 කට අධික ප්‍රමාණයක් හා ජංගම දුරකථන විශාල ප්‍රමාණයක්** පොලිස් භාරයට ගෙන ඇත. මෙම චීන ජාතිකයින් මෙම හෝටලයේ කාමර 47 ක් වෙන් කරවාගෙන සිට ඇති අතර, එම හෝටලයේ පිහිටි උත්සව ශාලාවේ මේස දමා පරිගණක යන්ත්‍ර භාවිතා කර මෙම කටයුතු සිදුකර ඇති බවට නිරීක්ෂණය වී ඇත. මෙම හෝටලයේ රැඳී සිටිමින් මුදල් වංචා සඳහා චීන ජාතිකයින් සම්බන්ධීකරණය සිදුකරමින් සිටි බවට ලැබී ඇති තොරතුරු අනුව ශ්‍රී ලාංකික පුද්ගලයෙකුගෙන්ද විමර්ශන නිලධාරීන් ප්‍රශ්න කරගෙන යනු ලබයි.

වැඩබලන පොලිස්පති තුමා විසින් මෙම සිද්ධිය සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන සිදු කිරීමට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත නියෝග කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**